(02) පහත දී ඇති ප්‍රමේයයන් ව්‍යුත්පන්න ක්‍රමයෙන් සාධණය කරන්න.

i. $((P \vee Q) \vee \sim P)$

ii. $[P \rightarrow (\sim P \rightarrow Q)]$

iii. $[(P \wedge Q) \rightarrow (P \rightarrow (Q \vee R))]$

iv. $[(P \rightarrow Q) \vee (Q \rightarrow R)]$

(ලකුණු 04x5=20යි)

(03) පහත දී ඇති තර්ක ඔබගේ සංක්ෂේපණ රටාව ලියා දක්වමින් සංකේතකරණය කොට ඒවායෙහි සප්‍රමාණ/නිෂ්ප්‍රමාණ බව සත්‍ය චක්‍ර චක්‍ර ක්‍රමයෙන් සාධනය කරන්න.

i. රාධා ශ්‍රී ලාංකික ගැනු ළමයෙක්වත් ඉන්දියානු ගැහැණු ළමයෙක්වත් නොවේ. ඇය ශ්‍රී ලාංකීය ගැහැණු ළමයෙක් නොවේ නම් එවිට ඇය පකිස්තානු ගැහැණු ළමයෙක් නොවේ. එමනිසා රාධා එක්කෝ පකිස්තානු නැත්නම් බංග්ලාදේශයේ ගැහැණු ළමයෙකි.

ii. කායික හා මානසික යන දඬුවම් දෙකම පෞරුෂයට හානිකර වේ. මානසික දඬුවම් පෞරුෂයට හානි කර නම් එවිට ගුරුවරුන්ට හා දෙමාපියන්ට සිසුන්ව විවේචනය කළ නොහැකිය. එමනිසා ගුරුවරුන් සිසුන්ව විවේචනය කළහොත් එවිට පොලීසියට ඔවුන්ව අත්අඩංගුවට ගත හැකිය.

iii. අප පරිසරය සුරකින්නේ නම් හා නම් පමණක් අපට අනාගත පරපුර වෙුනවෙන් ලෝකය ආරක්ෂා කළ හැකිය. අපට අනාගත පරපුර වෙනුවෙන් ලෝකය ආරක්ෂා කළ හැකි නම් එවිට ඔවුන් අපට ගරු කරනු ඇත. එමනිසා ඔවුන් අපට ගරු කරන්නේ නම් පමණක් අප පරිසරය සුරකිමු.

iv. ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යන දෙදෙනාම විඥානවාදීන් ය යන ප්‍රකාශනය අසත්‍ය වේ. ප්ලේටෝ විඥානවාදියෙකි. එමනිසා ඇරිස්ටෝටල් විඥානවාදියෙක් නොවේ.

(ලකුණු 05x4=20යි)

(04) පහත දී ඇති තර්ක ඔබගේ සංක්ෂේපණ රටාව ලියා දක්වමින් වර්ග තර්ක ශාස්ත්‍රයට අනුව සංකේතකරණය කොට ඒවායෙහි සප්‍රමාණ/නිෂ්ප්‍රමාණ බව වෙන් රූප ඇසුරෙන් විභාග කරන්න.

i. කිසිම බල්ලෙක් පූසෙක් නොවේ. මගේ සුරතලා බල්ලෙකි. එමනිසා මගේ පූසා සුරතලෙක් නොවේ.

ii. ඇතැම් දාර්ශනිකයින් විද්‍යාඥයන් ය. ඩේකාට් දාර්ශනිකයෙකි. එමනිසා ඔහු විද්‍යාඥයෙකි.

iii. සියලු ශිෂ්‍යයෝ විදේශිකයෝ ය. ඇතැම් විදෙශිකයෝ පිරිමි අය ය. එමනිසා ඇතැම් පිරිමි අය ශිෂ්‍යයන් ය.

iv. කපුටෝ පමණක් දක්ෂය ය. කපුටෝ පමණක් කපටි ය. එමනිසා සියලු කපටි අය දක්ෂ ය.

(ලකුණු 04x5=20යි)

(05) පහත සඳහන් ඕනෑම **හතරකට** (04) කෙටි සටහන් ලියන්න.

1. චක්‍ර සත්‍ය චක්‍ර ක්‍රමය
2. වර්ග අනුපූරකය
3. සංකේත තර්ක ශාස්ත්‍රය
4. අසම්භාව්‍ය ව්‍යුත්පන්න ක්‍රමය
5. සරල වාක්‍ය
6. තර්ක ශාස්ත්‍රය නිර්වචනය කිරීම

(ලකුණු 04x5=20යි)

## II කොටස

(06) (අ) කාර්ල් පොපර්ගේ වෙන් කර ගැනීමේ රීතිය ඇසුරෙන් විද්‍යා හා න-විද්‍යා අතර වෙනස දක්වන්න. (ලකුණු 10යි)

(ආ) පහත දී ඇති විෂයයන් අතුරෙන් ස්වභාවික විද්‍යා, සාමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර යන ප්‍රභේදයන්ට අයත් විෂයයන් වෙන් කොට ලියා දක්වන්න.

භූගෝලවිද්‍යාව, නාට්‍ය කලාව, ආර්ථික විද්‍යාව, ජෛව රසායන විද්‍යාව , කායික විද්‍යාව, ප්‍රංශ භාෂාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, දේශපාලන විද්‍යාව, තාරකා විද්‍යාව, ප්‍රවේණි විද්‍යාව.

(ලකුණු 10යි)

(07) (අ) "නිරීක්ෂණයන්ට වඩා සම්පරීක්ෂණ මගින් වඩාත් වාස්තවික දැනුම ලබාදෙයි." මෙම ප්‍රකාශනය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

(ආ) පහත ඒවා නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

i. නිර්ණය පරීක්ෂණ
ii. පරමාදර්ශී සම්පරීක්ෂණ

(ලකුණු 05x2=10යි)

(08) (අ) ප්‍රැන්සිස් බේකන් ඉදිරිපත් කළ උද්ගමනවාදයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 06යි)

(ආ) නිගාමී සත්‍යොක්ෂණවාදය හා නිගාමී අසත්‍යොක්ෂණවාදය අතර සම විෂමතා දක්වන්න.

(ලකුණු 02x6=12යි)

(09) (අ) සාමාජීය විද්‍යාවන්වල සම්පරීක්ෂණ පැවැත්වීම අසීරු වන්නේ ඇයිදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)

(ආ) ''සමාජීය විද්‍යාවන්ගේ වාස්විකත්වය පිළිබඳ ගැටළුව පරීක්ෂා කරන්න.

(ලකුණු 10 යි)

(10) පහත දී ඇති **ඕනෑම හතරකට** (04) කෙටි සටහන් ලියන්න.

i) සෝපන්‍යාස ව්‍යාඛ්‍යානය.

ii) හේතුමය ව්‍යාඛ්‍යානය.

iii) මිණුමෙහි උපයෝගිතාවය.

iv) කොපර්නිකානු විප්ලවය.

v) ආනුභූතික හා ආනුභූතික නොවන විද්‍යා

vi) විද්‍යාව හා ආගම

(ලකුණු 05x4=20යි)

UNIVERSITY OF PERADENIYA

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

Bachelor of Arts (External –New Syllabus) Examination 100 Level – 2025

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 100 මට්ටම - 2025

கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 100 வது தேர்ச்சி மட்டம் – 2025

## (SUPE 104- LOGIC AND SCIENTIFIC METHOD)

## (SUPE 104- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය)

කාලය පැය **(03)** තුනයි.
மூன்று**(03)** மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

පළමු කොටසෙන් අඩුම තරමේ ප්‍රශ්න දෙකක් (02) ද
දෙවන කොටසෙන් අඩුම තරමේ ප්‍රශ්න එකක් (01) ද
තෝරාගෙන ප්‍රශ්න පහකට(05) පමණක් පිළිතුරු සපයන්න
பகுதி ஒன்றில் குறைந்தது இரண்டு வினாக்களுக்கும் பகுதி இரண்டில் குறைந்தது ஒரு வினாவுமாக மொத்தம் **05** வினாக்களுக்கு மட்டும் விடையளிக்குக.
Answer **Five** (05) Questions only, selecting at least **two** (02) from part I and at least **one** (01) from part II.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව **10** කි.
There are **10** questions in the question paper.
இந்த வினாப்பத்திரத்தில் **10** வினாக்கள் உள்ளன.

---

### I කොටස

(01) පහත දී ඇති තර්ක ඔබගේ සංක්ෂේපණ රටාව ලියා දක්වමින් සංකේතකරණය කොට ව්‍යුත්පන්න ක්‍රමයෙන් සාධනය කරන්න.

(i) ඔහු ගුරුවරයෙක් යැයි දෙන ලද විට ඇය ගායිකාවක් වේ. ඇය ගායිකාවක් වේ යන ප්‍රකාශනය අසත්‍යය වේ. එමනිසා එක්කෝ ඔහු ගුරුවරයෙක් නොවේ නැත්නම් ඔහු නළුවෙකි.

(ii) ප්ලේටෝ දාර්ශනිකයෙක් නම් එවිට බෘනෝ විද්‍යාඥයෙකි. බෘනෝ විද්‍යාඥයෙක් නම් එවිට ශේක්ස්පියර් කලාකරුවෙකි. ප්ලේටෝ දාර්ශනිකයෙක් වන අතර ඩේවිඩ් අනුභූතිවාදියෙකි. එමනිසා ශේක්ස්පියර් කලාකරුවෙක් වන අතර ඩේවිඩ් අනුභූතිවාදියෙක් වේ.

(iii) තුන්වැනි ලෝක යුද්ධය ආරම්භ වන්නේ නම් එවිට පිට සක්වල ජීවීන් යුද්ධයට මැදිහත් වේය යන ප්‍රකාශනය අසත්‍ය වේ. පිටසක්වල ජීවීන් යුද්ධයට මැදිහත් වනු ඇත. එමනිසා අපට යුද්ධය නතර කිරීමට සිදු වේ.

(iv) රාමා සීතාට ආදරය කරන්නේ නම් හා නම් පමණක් රාවණා සීතාව පැහැර ගනී. එක්කෝ රාවණා සීතාව පැහැර ගනී, නැත්නම් රාවණා රාමව මරනු ඇත. රාවණා රාමාව මරන්නේය යන්න අසත්‍ය වේ. එබැවින් රාමා සීතාට ආදරය කරයි.

(ලකුණු 04x5=20යි)

අ.පි.බ.